**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී . තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති , පටිපාටි පොත්පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව , විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේඇතුළත්කරඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිති අංක 01 හි 24 ඡේදය ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා හා ගිණුම් සංඛ්‍යා අතර සංසන්දනාත්මක වාර්තාව අනුව අයවැයගත අගයන්ගෙන් සත්‍ය අගයන් ඉක්මවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයයේ වූ පාද සටහනක් මගින් අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතුකරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | ප්‍රමිති අංක 07 හි 50 ඡේදය ප්‍රකාරව එකිනෙකින් වෙනස් වූ වත්කම් පන්තීන් වෙන වෙනම දැක්විය යුතු වුවත්, ආයතනයේ ඉඩම් හා මාර්ග එකම ස්වභාවයේ හා එකම පන්තියේ වත්කම් ලෙස දක්වා තිබුණි. | ඒ පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ප්‍රදාන උපයෝගී කරගනිමින් අත්පත් කරගෙන තිබූ ඉඩම් හා මාර්ග වටිනාකම ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳව සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ශිෂ්‍යාධාර සහ මහපොල සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් මුදල් පදනම මත ගිණුම්ගත කරන ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ උපචිත පදනම මත ගිණුම්ගත කර තිබුණි. | මහපොල, ශිෂ්‍යාධාර මුදල් පදනම මත ගිණුම් තබන අතර ගෙවීම් කිරීමේදී පළමුව විශ්වවිද්‍යාලය මගින් ගෙවීම කර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ලැබිය යුතු මහපොල, ශිෂ්‍යාධාර ලෙස ගිණුම්ගත කර ඇත්තේ ප්‍රතිපූරණය කර ගැනීමට ඇති එම මුදල වේ. | අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල රු. 2,599,343 ක් වූ සැපයුම් ණයහිමි හා වත්කම් අගයන් ගිණුම් වලින් අත්හැරී තිබුණි. | විගණන විමසුමෙහි මිලදී ගැනීම්වලට අදාල ගෙවීම් පරීක්ෂා කිරීමේදි අදාල ඉන්වොයිස් 2018 වර්ෂයේ නිකුත් කර ඇති බවට තහවුරු වේ. නමුත් අදාල අංශ ප්‍රධානීන් විසින් 2019 වර්ෂයේ ඉන්වෙන්ට්‍රි , සේවා සහතික අත්සන් කර ඇති බැවින් 2019 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති බව සලකා 2019 වර්ෂයේ වත්කම් ලෙස ගිණුම් ගතකර ඇත. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුයි. |
| (ආ) | විදේශගත වී නියමිත කාල සීමාව තුල නොපැමිණ ගිවිසුම් කඩකර තිබූ කථිකාචාර්යවරුන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු රු.792,308ක් වූ පාරිතෝෂික වෙන් කිරීම ගිණුම්වලින් අත්හැරී තිබුණි. | විදේශගතවී නියමිත කාල සීමාව තුල නොපැමිණී ගිවිසුම කඩකර තිබූ කථිකාචාර්යවරුන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු පාරිතෝෂික වෙන්කිරීම් ගිණුම්වලින් අත්හැරී තිබූ අතර එය නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මූලික ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පසුගිය වර්ෂවලදී රු.1,279,086ක් වූ වැඩිපුර ගෙවන ලද වැටුප් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඒ.එන්.කේ. පෙරේරා මහත්මියගෙන් අයකර ගත යුතු මුදල වහාම අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ආර්.පී.අයි.ආර් සේනාරත්න මහතාගෙන් අයකර ගත යුතු මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කර ගැනීමේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මූලික ගිණුම්කරණ මූලධර්මවලට අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දැනට වැඩ නිමවී නොමැති කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් 2018 වර්ෂයේදී ලැබී තිබූ රු.1,330,500ක් වූ දිශා දක්වන විදුලි ආලෝක කණු 40 ක්ද, අවසන් තොග ලෙස දැක්වීම හේතුවෙන් නඩත්තු තොග වටිනාකම රු.1,330,500කින් වැඩියෙන් දක්වා තිබුණි. | කොන්ත්‍රාත් කාර්යයන් යටතේ ලැබී තිබුණු මාර්ග ආලෝක කණු 40 විශ්වවිද්‍යාලයේ සිටුවීම සඳහා ගබඩාවේ තබා තිබුණි. මේ හේතුවෙන් තොගය වැඩියෙන් ගණනය කර තිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් තව ලැබීමට නියමිත පහන් සහ සිංහ රූප ලබාගෙන මෙම පහන් කණු අදාල ස්ථානවල සිටුවා, මෙම කොන්ත්‍රාත් කාර්යය සම්පූර්ණයෙන් නිම කර අදාළ අත්තිකාරම් මුදල පියවීමෙන් පසු මෙම පහන් කණු තොගයෙන් ඉවත් කළ හැක. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකළ යුතු විදුලි ගාස්තු රු.4,078,948ක් වූ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කළ යුතු විදුලි වියදම අයකර ගැනීම සඳහා දැනුවත් කිරීමේ ලිපි කොන්ත්‍රාත්කරුවන් වෙත යවා ඇත. විදුලි වියදම් පියවූ පසු එම රිසිට්පත් කොන්ත්‍රාත්කරුවන් විසින් මූලධන අංශය වෙත ඉදිරිපත් කරනු ලබන අතර නොපියවූ විදුලි වියදම් වේනම් ඒවා අදාළ කොන්ත්‍රාත්තු අවසන් බිල්පතෙන් අයකර ගනී. කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයවිය යුතු විදුලි වියදම පියවා ගැනීම විශ්වවිද්‍යාලයීය ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුව බල නොපාන බැවින් එම වටිනාකම් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත නොකරයි. | ආයතනයට අයවිය යුතු ලෙස හඳුනාගෙන ඇති සියළුම ආදායම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ. |
| (ඊ) | වෛද්‍ය පීඨයේ නේවාසිකාගාරවල ඉදිකිරීම් සම්බන්ධයෙන් වූ රු.5,845,478ක අතිරේක වැඩ වටිනාකමක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | වෛද්‍ය පීඨ නේවාසිකාගාරය කොටස් 02කට වෙන්කිරීමේ පිරිවැය ලෙස ගෙවිය යුතු මෙම මුදල විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදනවලින් ගෙවීම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව ඉදිරියේදී ගෙවීම සඳහා කටයුතු කරනු ලැබේ. අදාළ අනුමැතීන්ගෙන් තොරව මෙම වටිනාකම ගිණුම්ගත කළ නොහැක. | නේවාසිකාගාර දැනට ප්‍රයෝජනයට ගෙන ඇති බැවින් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් ඉදිකර විශ්ව විද්‍යාලය වෙත පවරා දී නේවාසිකාගාර දෙකක එකතු වටිනාකම රු.733,741,515ක් ගිණුම්ගත නොකිරීම නිසා එම වටිනාකමින් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | වෛද්‍ය පීඨය සඳහා වටිනාකමින් රු.212,678,700ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදී තිබූ අතර එහි අතිරේක වැඩ වටිනාකම වූ රු.5,845,478ක පිරිවැය ගෙවීම් කටයුතු නිරාකරණය කර ගැනීමෙන් පසුව නේවාසිකාගාරය සඳහා වූ මුළු වටිනාකම ගිණුමගත කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් කුලියාපිටිය පරිශ්‍රයේ ඉදි කරන ලද රු.425,357,400ක් වූ නේවාසිකාගාර 02හි වටිනාකම මෙම වර්ෂය තුලදී ගිණුම්ගත කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පොලී ආදායමෙන් අයකර තිබූ රු.530,624ක් වූ රඳවා ගැනීම් බදු බැංකු ගාස්තු ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

**------------------------------------------**

| | <u>විෂයය</u> | <u>මුදල</u> (රු.) | <u>නොසැපයූ විගණන සාක්ෂි</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් | 391,105,735 | **(i)** වටිනාකම සංයුක්ත වී ඇති ඉඩම් ප්‍රමාණයන්<br>**(ii)** ඉඩම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය | ඉඩම් සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් නොමැති අතර මේ වන විට වයඹ විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගත් සියළුම ඉඩම් වලට අදාල පැවරුම් නියෝග රජයේ විගණනය වෙත ලබා දී ඇත. මේ වන විට භුක්ති විඳින එහෙත් නීත්‍යානුකූල අයිතිය ලබාගෙන නැති අනෙකුත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | පවත්නා නීති රීති අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ලී බඩු සවිකිරීම් 235,126,605<br>(ඇ) කාර්යාල උපකරණ 154,267,123<br>(ඈ) විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ 184,273,729<br>(ඉ) පුස්තකාල පොත්, සඟරා 15,985,532<br>(ඊ) උපාධි කබා 427,787<br>} භාණ්ඩ සමීක්ෂණ වාර්තා | 2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ 2018-01-15 දිනට ප්‍රථම සිදුකර අදාල වාර්තා ඉදිරිපත් කරන ලෙස 2017.12.14 දිනැති ලිපිය මගින් සියළු සමීක්ෂණ කමිටු දැනුවත් කර ඇත. 2018 වර්ෂයේ මාර්තු මස ඇතිවූ විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ වර්ජනය හේතුවෙන් වාර්තා ලබාදීම ප්‍රමාද විය. සිහි කැඳවීම් ලිපි යැවීමෙන් අනතුරුව ලද සියළු වාර්තා 2018.11.14 දින සහකාර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල ණය රු.159,820ක් වූ ශේෂ 03ක් වර්ෂ 06 ක සිට 12 ක කාල පරාසයක සිට අයවීමකින් තොරව පැවතුණි. | ටී.එම්.සී.පී. ගුණසේකර - ආපදා ණය 114,240<br>- සේවක ණය 4,080<br>ඩබ්.පී.ඊ. ප්‍රියදර්ශන - සේවක ණය 41,500<br>----------<br>159,820<br>======<br>ඉහත ආචාර්යවරුන් විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත් වී ඇති බැවින් මෙම ශේෂයන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අඩුකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවියයුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තිය හා 2005 ජූලි 13 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ස්වයං අධ්‍යයන පාඨමාලා 06ක රු.34,500,000ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල පාලක සභාවේ 2018.10.25 දින පැවති 193 වෙනි සභා වාරයේදී අනුමැතිය ලබාදී ඇති අතර මහා භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා ලිපියක් 2018.12.20 දින යොමු කර ඇත. | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | බාහිර පාඨමාලා ගාස්තුවලින් වෙනත් කාර්යයන් සඳහා වැය දැරීමට අනුමැතිය ලබාදී නැතත් විශ්වවිද්‍යාලයේ සුභසාධන අරමුදලට රු.544,585ක් හා වෙනත් කාර්යයන් සඳහා රු.2,205,657ක් බාහිර පාඨමාලා ගාස්තුවලින් වැයකර තිබුණි. | පාලක සභා අනුමැතිය යටතේ පාඨමාලා අයවැයෙන් වෙන් කරනු ලබන චක්‍ර පිරිවැයෙන් 1%ක් සේවක සුභසාධන අරමුදලට මාරු කරනු ලැබේ. බාහිර පාඨමාලා ගාස්තුවලින් වෙනත් කාර්යයන් සඳහා වැය කරනු ලබන්නේ ව්‍යාපෘති සංවර්ධන අරමුදලෙනි. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) | <u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය</u> | | | |
| (i) | XX වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාලයේ අධ්‍යයන අංශයේ නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | නීති රීති වලට අනුව කටයුතු කල යුතුය. |
| (ii) | XXVI වැනි පරිච්ඡේදයේ 2.9 උප ඡේදය (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 04/2013 වන ආයතන චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ කටයුතු දෙසැම්බර් මාසය අවසාන වීමට පෙර ආරම්භ කර ජනවාරි මස 15 වන දිනට පෙර අවසන් වන | භාණ්ඩ සමීක්ෂණ 2018-01-15 දිනට ප්‍රථම සිදුකර අදාල වාර්තා ඉදිරිපත් කරන ලෙස 2017.12.14 දිනැති ලිපිය මගින් සියළු සමීක්ෂණ කමිටු දැනුවත් කර ඇත. 2018 වර්ෂයේ | නීති රීතිවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | මගින් සංශෝධිත) | පරිදි සිදු කිරීමට සැළසුම් කර නොතිබුණි. | මාර්තු මස ඇතිවූ විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ වර්ජනය හේතුවෙන් වාර්තා ලබාදීම ප්‍රමාද විය. සිහිකැඳවීම් ලිපි යැවීමෙන් අනතුරුව ලද සියළු වාර්තා 2018.11.14 දින සහකාර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | |
| **(iii)** | XXVI පරිච්ඡේදයේ 3.1 උප ඡේදය (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 04/2013 වන ආයතන චක්‍රලේඛය මගින් සංශෝධිත) | 2018 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2019 පෙබරවාරි මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | නීති රීතිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| **(IV)** | XXVI පරිච්ඡේදයේ 4 උප ඡේදය | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් පාවිච්චි කළ නොහැකි හා නුසුදුසු හැටියට ප්‍රකාශ කරන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් විවෘත ටෙන්ඩර් කැඳවීම් මගින් බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | අංශ මගින් එවන ලද පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ඉවත් කිරීම සඳහා එවන ලද සමහර වාර්තා වල අදාල භාණ්ඩ මිළදීගත් දිනය සහ වටිනාකම සඳහන් කර නොතිබුණි. එමෙන්ම මෙම වාර්තා ලැබෙන අවස්ථාව වන විට 2018 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු ආරම්භ කර තිබූ බැවින් පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ඉවත් කිරීමේ කටයුතු ඒ සමග සිදු කිරීමට නියමිතය. | නීති රීතිවලට අනුකූලව යාවත්කාලීනව කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | 2017 නොවැම්බර් 28 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අංක 10 | ස්වයං මූල්‍ය පාඨමාලා ගිණුම් හා ඉතිරි මුදල් පිළිබඳව උපදෙස් ලබාදී තිබියදී එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි. | බාහිර පාඨමාලා අධ්‍යක්ෂවරුන් විසින් දැනුම් දෙනු ලබන්නා වූ නිශ්චිත වශයෙන්ම අවසන් කරන ලද පාඨමාලාවල අතිරික්ත මුදල් Programme Development Fund යටතට මාරු කිරීම සුදුසු බව 63 වන විගණන කමිටුවේදී තීරණය කරන ලදී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය අනුව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.159,337,064ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.67,708,979ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි තවදුරටත් රු.91,628,085ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා ගිවිසුම්ගත සේවා වියදම හා ක්ෂය වෙන්කිරීම් අගය වැඩිවීම ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ හතරක දායකත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ඌනතාවය | (159,337,064) | (67,708,979) | (204,029,628) | (103,698,892) | (101,915,819) |
| එකතුකළා | | | | | |
| සේවක පාරිශ්‍රමික | 926,452,712 | 738,119,700 | 645,615,622 | 580,380,223 | 467,368,504 |
| ක්ෂයවීම් | 417,196,606 | 383,187,600 | 256,798,190 | 152,595,640 | 130,886,772 |
| අගය එකතු කිරීම් | 1,184,312,254 | 1,053,598,321 | 698,384,184 | 629,276,971 | 496,339,457 |

2014 වර්ෂයේ සිට ඌනතාවය අඩු/වැඩි වෙමින් සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය වැඩිවී තිබුණද සේවක පරිශ්‍රමිකය හා ක්ෂයවීම්ද අඛණ්ඩව වැඩිවී තිබුණි. ඒ අනුව අගය එකතු කිරීමද අඛණ්ඩව වර්ධනය වී තිබුණි

### 2.2 ප්‍රධාන අදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------

| | සමාලෝචිත වර්ෂය | පෙර වර්ෂය | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | |
| ආදායම් | | | | |
| රජයේ ප්‍රදාන | 1,546,243 | 1,415,167 | 131,076 | 9 |
| විශ්වවිද්‍යාලයේ ආදායම් | 28,899 | 29,280 | (381) | (1) |
| | 1,575,142 | 1,444,447 | 130,695 | 9 |

| වියදම් | | | | |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 930,846 | 748,531 | 182,315 | 24 |
| ක්ෂය | 417,197 | 383,188 | 34,009 | 9 |
| අනෙකුත් වියදම් | 386,436 | 380,437 | 5,999 | 2 |
| | ------------ | -------------- | ------------- | |
| මුළු වියදම් | 1,734,479 | 1,512,156 | 222,323 | 15 |
| | ======= | ======== | ======= | |
| ඌනතාවය | (159,337) | (67,709) | 91,628 | (135) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ සමස්ත ආදායම සියයට 9කින් වර්ධනයක් පෙන්නුම් කළ අතර එම වර්ධනය තුල රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය සියයට 2ක් ඇතළත්ව තිබූ අතර විශ්වවිද්‍යාලයේ ආදායම් උත්පාදනය සියයට 1ක පිරිහීමක් සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම සියයට 15කින් වැඩිවී තිබූ අතර ඒ තුල රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් වැඩිවීම නිසා පෞද්ගලික පඩිනඩි සියයට 24කින්ද හා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය සියයට 9කින් වැඩිවීමද බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සියයට 135කින් වර්ධනය වී තිබුණි.

**2.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයේ ජංගම අනුපාතය 2:2.54 ක් වූ අතර, එහි සම්මත අනුපාතය 2:1ක් වූයෙන් සම්මත අනුපාතය ඉක්මවන ලද 1.54 ක ජංගම වගකීමක් අනාවරණය විය. ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 2:1.86ක් වූයෙන් තව දුරටත් පෙර වර්ෂයට වඩා ජංගම අනුපාතය 0.86ක පිරිහීමක් අනාවරණය විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 හඳුනාගත් පාඩු**

-----------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂයේ ජනවාරි හා සැප්තැම්බර් මාසවල සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවිය යුතු දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් අවස්ථා දෙකකදී රු.60,782 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | සේවා නියුක්ති භාර අරමුදල ගෙවීමට අදාළ ප්‍රේෂණ නිවේදන ආකෘති පත්‍ර (R 1) නොලැබීම හේතුවෙන්# ඒ සම්බන්ධව ප්‍රධාන කාර්යාලයෙන් හා කුරුණෑගල ශාඛාවෙන් විමසා අනතුරුව වෙබ් පිටුවෙන් බාගත කර ගැනීමට උපදෙස් ලැබී තිබුණු අතර ඒ අනුව 2017.03.03 දින අදාළ චෙක්පත තැපැලට යොමු කර ඇත. එහිදී | ප්‍රමාදයට හේතු හඳුනාගෙන වගකීම් නිශ්චය කර පාඩුව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සිදුවූ ප්‍රමාද දෝෂය සම්බන්ධයෙන් 2017.07.28 දින සේ.නි.හා. අරමුදල් මණ්ඩලය විසින් අධිහාර නිවේදන නිකුත් කර ඇත. | |
| (ආ) වයඹ ජාත්‍යන්තර සමුළුව 2018 (**Winc**) සඳහා මිලදීගෙන තිබුණු රු.53,529 ක් වූ ලිපිද්‍රව්‍ය ඌනතාවයක් තිබුණි. | විමසුමට අනුව වයඹ ජාත්‍යන්තර සමුළුව 2018 (WinC) සඳහා ලබාගත් ලිපිද්‍රව්‍යවල ඌනතාවයක් ඇති බවට සඳහන් කර ඇතත් ඒවා සමුළුව සඳහා පැමිණි ප්‍රභූවරුන් සහ ආරධිත අමුත්තන් වෙත ලබාදුන් අතර ලියාපදිංචි සහභාගීවන්නන් සඳහා ලිපිද්‍රව්‍ය නිකුත් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය ආරාධිතයන් සඳහාද භාවිතා කිරීම උචිත නොවේ. ඒ අනුව ඌනතාවයක් ලෙස නිරීක්ෂණය වූ අයිතම ආරාධිතයන් සඳහා නිකුත් කරනු ලැබ ඇත. | ඌනතාවයට හේතු හඳුනාගෙන වගකීම් නිශ්චය කර ඌනතාවය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------

| <u>විගණන නිරීක්ෂණ</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ රු.1,430,500ක් වූ ප්‍රතිපාදන මත ව්‍යාපෘති 02 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිමකිරීම සඳහා අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාලය අතර ගිවිසුම්වලට එළඹ තිබුණද, 2018 වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘති නිමකර නොතිබුණි. | කුලියාපිටිය පරිශ්‍රය සඳහා ප්‍රදානය කළ වාරියපොළ ආර්ථික මධ්‍යස්ථානයේ ශක්‍යතාවය බැලීම සඳහා සිදුකළ වෙළඳපොළ පර්යේෂණය යන ව්‍යාපෘතිය අවසන් කිරීමට තරමක ප්‍රමාදයක් සිදු වූයේ ව්‍යාපෘතිය සිදු කිරීමට අදාළව විවිධ පාර්ශවයන් හමුවී දත්ත ලබා ගැනීමට වැඩි කාලයක් ගතවීම සහ පර්යේෂණයේ පසු ප්‍රතිඵලයක් ලෙස මෙම ආර්ථික මධ්‍යස්ථානයට සමාන වූ තවත් ක්ෂේත්‍රයන් 07ක් අධ්‍යයනය කිරීමට සැලසුම් කිරීමෙන් විෂයපථය තවත් පුළුල්වීම යන කාරණා නිසාය. | නියමිත කාලය තුළ කාර්යය නිමකර ඵලදායිතාවය වැඩිකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) එක් එක් වසර සඳහා එක් එක් පීඨයන්ට බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයන වර්ෂ 04 ක තොරතුරු පහත දැක්වේ.

| පීඨය | අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව් වන වසර |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 150 | 160 | 136 | 138 | 160 |
| | 86 | 86 | 82 | - | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 200 | 169 | 158 | 141 | 79 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 550 | 539 | - | - | - |
| | 500 | - | 484 | 452 | - |
| | 350 | - | - | - | 351 |
| පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය | 110 | 103 | 63 | 66 | 67 |
| | 85 | 72 | - | - | - |
| | 60 | - | 25 | 19 | 27 |
| තාක්ෂණ පීඨය | 161 | 156 | 136 | - | - |
| වෛද්‍ය පීඨය | 75 | 72 | - | - | - |
| | | 1357 | 1092 | 819 | 684 |

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017/2018 අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් 1472 ක් ඇතුළත් කරගැනීමට සැළසුම් කර තිබූ අතර බඳවා ගත් සංඛ්‍යාව 1357 කි. ඒ අනුව සියයට 4ක ප්‍රමාණයක් බඳවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර වෛද්‍ය පීඨය සඳහා සිසුන් 75 ක් බඳවා ගත හැකිව තිබුණද බඳවාගෙන තිබුණේ සිසුන් 72 කි. ව්‍යවහාරික විද්‍යා පියය සඳහා 200 බඳවාගත හැකිව තිබුණද බඳවාගෙන තිබුණේ 169 ක් පමණි. | වෛද්‍ය පීඨයට සිසුන් 72ක් පමණක් බඳවා ගැනීමට හේතු වූ කරුණු වෛද්‍ය පීඨයෙන් පරිබාහිරව සහ වෛද්‍ය පීඨයට පාලනයක් නැති හේතු නිසා සිදු විය. ඉදිරි වසරේදී මෙම තත්ත්වය ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ස්ථාවර කමිටුවට පීඨාධිපති විසින් දැනුවත් කර ඇත. | අපේක්ෂිත තත්ත්වයන් සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාවේ 2017 වර්ෂයේදී ශිෂ්‍යයන් 120 දෙනෙකු ගෙන් විභාගය සම්පූර්ණ නොකළ සිසුන් 62ක් වූ සංඛ්‍යාවෙන් 2017 ජූලි හා 2018 ජනවාරි මාසවලදි උපාධිය සම්පූර්ණ කර තිබුණේ පිළිවෙලින් සිසුන් 11ක් හා 09 කි. | 2017 හා 2018 වර්ෂයන්හි දී ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාවේ සිසුන් සමහරකට පළමු අවස්ථාවේදීම තම උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. එහෙත් මෙම සිසුන් සියලු දෙනාම නිශ්චිත කාලයක් (අධ්‍යයන වර්ෂ) තුල තමන්ගේ උපාධිය සම්පූර්ණ කල යුතු බැවින් එම කාලය තුලදී එම සිසුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ගනු ඇතැයි අපේක්ෂිතය. | පවතින තත්ත්වය උසස් මට්ටමකට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | තාක්ෂණ පීඨය ආරම්භ කර වසර 02ක් ගතවී තිබුණද මෙම පීඨය සඳහා අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට නොහැකි වී තිබුණි. 2017 වර්ෂයේදී ආරම්භ කර තිබූ තාක්ෂණ විෂයයට අදාළව ප්‍රායෝගීක පුහුණුව සඳහා රු.19,826,756ක් වූ යන්ත්‍රෝපකරණ මිලදී ගෙන තිබුණද , එම යන්ත්‍ර උපයෝජනය කර 2018 වර්ෂයේදි පළමු වසරේ හා දෙවන වසරේ සිසුන් වෙනුවෙන් ප්‍රායෝගීක පුහුණුවීම් සිදුකර නොතිබුණි. | විශ්ව විද්‍යාලය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී සැමවිටම ශිෂ්‍ය ඉගැනුම් අවශ්‍යතාවය මත පමණක් මිලදී ගැනීම් කරනු ලබන අතර, ඒවා ඌන උපයෝජනයකින් තොරව සිසුන්ගේ ප්‍රායෝගීක පුහුණුවීම් සඳහා ලබාදෙනු ලබයි. | අධ්‍යන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කලයුතු අතර, සිසුන්ට ප්‍රයෝගික පුහුණුව හැකිතරම් කඩිනමින් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | රු.3, 835,000ට තක්සේරු කරන ලද පර්චස් 711ක කුඹුරු ඉඩම් කොටස් 08ක් අත්පත්කර ගැනීම සඳහා 2013 වර්ෂයේදි රු.1,013,750ක් පන්නල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පත්කර ඇතත්, අදාළ කුඹුරු ඉඩම් පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් කැබලි 08 පවරා ගැනීම සම්බන්ධව නෛතික වශයෙන් කටයුතු කිරීමේ හැකියාව හා බලතල ඇත්තේ පන්නල ප්‍රාදේශීය ලේකම්වරයාටය. මේ වනවිට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත 4(4) යටතේ විරෝධතා පරික්ෂණයක් සිදුකිරීමට හා අත්පත් කර ගැනීමේ කාර්යය කඩිනම් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධානය යටතේ ආඥාවක් ලබාගැනීම සඳහා ලේඛකාධිකාරිතුමා මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉල්ලීමක් කර ඇත. | කඩිනමින් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ලෝක ශ්‍රේණිගත කිරීම් සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව 2017 වර්ෂයේදී පිළිවෙලින් 5791 හා 08 වන ස්ථාන හිමිකරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් 8139 හා 08 වන ස්ථාන හිමි කරගෙන තිබුණි. | විශ්වවිද්‍යාලයට හිමි වන ස්ථානය වර්ධනය කර ගැනීම සඳහා විවිධ පර්යේෂණ සමුළු (ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ) කිහිපයක් 2018 වර්ෂයේදී පවත්වන ලද අතර ඉදිරියේදී විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්, පරිපාලන කාර්යය මණ්ඩලය, සිසුන් විසින් කරනු ලබන පර්යේෂණ ප්‍රමාණය වැඩි කිරීමට හා ඒවා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම මගින් විශ්වවිද්‍යාලයට හිමි වන ස්ථානය වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වෙමු. | ශ්‍රේණිගත කිරීම්වල ඉහළ වර්ධනයක් ලබා ගැනීමට කටයුතු කළයුතුය. |

(ඊ) **නොවිසඳී ඇති විගණන ඡේද**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී නියමිත කාලය තුල ආපසු නොපැමිණි කථිකාචාර්යවරු දෙදෙනෙකුගෙන් 2011 වසරේ සිට අයවිය යුතු රු.3,172,714ක් කඩිනමින් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | **ආර්.එම්.ඩබ්.එස්. රත්නායක** මහතා සතු ලක්ෂ 12ක් පමණ වන අර්ථසාධක arමුදලින් ලක්ෂ 9ක් පමණ වන විශ්වවිද්‍යාලයට අය විය යුතු මුදල අයකර ගැනීමට ඔහුගේ නිතීඥ මහතා හරහා කටයුතු කරමින් පවතී. **එච්.පී.ඒ. රූපසිංහ මහතා සම්බන්ධයෙන්** නීතිමය කටයුතු ආරම්භ කර ඇත. | ආයතනයට අයකර ගත යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ කිහිපයකට අදාලව විශ්වවිද්‍යාලය වෙත ලබාදී තිබූ ප්‍රාග්ධන අරමුදල් උපයෝජනය පිළිබද තොරතුරු පහත දැක්වේ. | නිරීක්ෂණය හා එකඟ වේ. | අරමුදල් ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| විස්තරය | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ආරම්භක ශේෂය | 38,556,947 | 67,905,448 | 1,033,030 | 12,754,413 |
| අරමුදල් ලැබීම් | 1,273,312,641 | 827,844,307 | 911,033,471 | 364,264,693 |
| මුළු දායකය | 1,311,869,588 | 895,749,755 | 912,066,501 | 377,019,106 |
| අරමුදල් උපයෝජනය | 1,206,918,074 | 807,464,357 | 743,336,061 | 262,865,324 |
| අරමුදල් ඉතිරිය | 104,951,513 | 88,285,398 | 168,730,440 | 114,153,782 |
| ගෙවිය යුතු බැරකම් | (49,072,102) | (49,728,450) | (100,824,992) | 113,120,752 |
| ශුද්ධ ඉතිරිය | 55,879,411 | 38,556,948 | 67,905,448 | 1,033,030 |

සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ 02 කදී භාණ්ඩාගාරයෙන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදී තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදලින් රු.55,879,411ක අරමුදල් උපයෝජනය කර නොතිබුණි .

## 3.5 නිශ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

---------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෑන් රථය 2014 වර්ෂයේ සිට 2019 පෙබරවාරි දක්වා ධාවන කටයුතු සඳහා යොදවාගෙන නොතිබූ අතර 2018 නොවැම්බර් 08 වන දින රු.175,000ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. | අංක 54 -1785 දරන වෑන් රථය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ජංගම බහුමාධ්‍ය ඒකකය නිර්මාණය කිරීම සඳහා අදාL අළුත්වැඩියා වලින් අනතුරුව භාර දීමට නියමිතය. | වත්කම් ඵලදායි ලෙස යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමකින් තොරව 2015 වර්ෂයේදී රු.680,041කට මිලදීගෙන තිබූ වෛද්‍ය උපකරණ නිශ්කාර්යව පැවතුණි. | 2015 නොවැම්බර් මස පමණ වන විට කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණු අතර ඉදිකිරීම් නවතා ඇති බව ලිපි මගින් වරින් වර උපකුලපතිතුමාට දැනුවත් කළද එම ඉදිකිරීම් සම්පූර්ණ කර ගැනීමට අද දක්වා නොහැකි වී ඇත.<br><br>භාණ්ඩ ඇණවුම් කරන අවස්ථාව වන විට වෛද්‍ය මධ්‍යස්ථානයේ වැඩ නිමවූ කොටසක් තිබූ අතර භාණ්ඩ ඉල්ලුම් කර ඇත්තේ ඉදිවෙමින් පවතින කොටසට හා වැඩ නිමවී තිබූ කොටසට වන අතර එහි ඉල්ලුම් කළ භාණ්ඩවලින් ඇතැම් භාණ්ඩ දැනට පරිභෝජනයට ගන්නා බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

----------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u> | | |
| 2014 අගෝස්තු 17 දිනට නිමකලයුතු මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම මේ දක්වා නිමකර නොතිබුණු අතර, කොන්ත්‍රාත්කරු විසින් අදාල කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. මේ සඳහා ගෙවා තිබුණු වැඩ අත්තිකාරම් රු.1,601,420ක් වූ මුදලද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බේරුම්කාර ආයතනය මගින්ද ලබා දුන් අවස්ථාවද පැහැර හැර ඇති බැවින් අවශ්‍යා දින වකවානු ලබා දෙමින් 2019 මාර්තු මස සිට මෙම ගිවිසුම අවලංගු කර ඇත. ඉටුකිරීමට ඇති සුළු නිමකිරීම් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ නඩත්තු අංශය මගින් කටයුතු සිදු කරමින් පවතී. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට හා ගොඩනැගිල්ලේ අවශ්‍ය අඩුපාඩු සකස්කර කඩිනමින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අත්සන් කළ ගිවිසුම අනුව, කොන්තxzත්කරුට ගෙවිය යුතු මුදලින් අවශ්‍ය අත්තිකාරම් හිලව් කරගෙන ඇති අතර, ඉතිරි මුදල සඳහා වන අත්තිකාරම් මුදල අයකර ගැනීමට ලංකා බැංකුවට ඇපකර භාර දී ඇති අතර තවමත් එම මුදල් බැංකුව විසින් විශ්වවිද්‍යාලයට ලබා දී නොමැත. ඒ සඳහා පසු විපරම් කිරීමේ කටයුතු කරනු ලැබේ. | |
| (ආ) **විදේශ ව්‍යාපෘති**<br>-----------------<br>වයඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සමාජ කටයුතු හා පීඨ සඳහා අධ්‍යයන උපකරණ ලබාදීම, වැඩිදියුණු කිරීම, ශක්තිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජවාදී ජනරජය ලෝක බැංකුව සමග ඒකාබද්ධව සිදුකරන උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය හා සංවර්ධන ක්‍රියාවන් කඩිනම් කිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 5ක ආධාර මුදල වෙනුවෙන් අදාළ යෝජනා සහ වියදම් සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් නොවිය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම Project Achievement Template (PAT) මගින් දක්වා ඇති අතර එය ගිවිසුමේ කොටසකි. ව්‍යාපෘති කටයුතු Project Achievement Template (PAT) අනුව කරගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, වයඹ විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවන්හි^ සහතික කළ පිටපත් අදාළ අංශ වෙතින් ඉල්ලුම් කර ඇති අතර එම පිටපත් ලද පසු රජයේ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යාපෘති කාර්යාලය මගින් අදාල ගිවිසුම්ගත වාර්තා ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වූ ඇස්තමේන්තුගත රුපියල් මිලියන 8.5 ක වන ව්‍යාපෘති 02 ඉටුකර නොතිබුණි. | **පුස්තකාල ශ්‍රවණාගාරය සඳහා භාණ්ඩ මිලට ගැනීම රුපියල් මිලියන 7.5කි.**<br><br>2018 වසරේ ඒ සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරි වර්ෂයකදී මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි.<br><br>එබැවින් එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 6ක් ප්‍රධාන ශ්‍රවණාගාරය සඳහා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යොදාගන්නා ලද අතර ඉතිරි | ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන පුස්තකාලය සඳහා උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලදී. ඉංග්‍රීසි ඒකකය සඳහා රසායනාගාර උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 01කි ඉංග්‍රීසි අධ්‍යයන අංශය මගින් භාණ්ඩ ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති බැවින් ඒ සඳහා මිලදී ගැනීමට කටයුතු කර නොමැත. | |
| (ආ) | පසුගිය වර්ෂවලදී ආරම්භ කර අවසන්ව නොතිබුණු ව්‍යාපෘති 16ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.198,216,000ක් ප්‍රතිපාදනය කර තිබුණද, යථෝක්ත චක්‍රලේඛයේ 10 වගන්තියට අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පසුගිය වර්ෂවලදී ආරම්භ කර අවසන්ව නොතිබුණු ව්‍යාපෘතිද ඇතුළත් කරමින් 2019 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී සියලු කරුණු සැලකිල්ලට ගෙන සකස් කළ යුතුය. |

**3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**-----------------------------------**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2014 ජූනි 26 දිනැති අංක HE/PR/2016/26 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඇමුණුම් අංක 01 හි තුන්වන තීරුව යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවට විස්තර දන්වා තිබූ ඉදිකිරීම් කටයුතු නියමිත කාල රාමුව තුල මුළු පිරිවැය විචලනයකින් තොරව සිදු කළ යුතු බව දක්වා තිබූ ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ රු.11,142,146ක් වූ අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර එහි අයිතම 10 අනුව විස්තරාත්මක උප ඇස්තමේන්තුවක් මගින් පවතින හා නව ගොඩනැගිල්ල සම්බන්ධ කිරීමක් ඉදිරිපත් කිරීමට රු.5,833,250ක් වටිනා එම ඇස්තමේන්තුව සමග හා 05 වන අයිතම මගින් පිළිවෙලින් රු.1,485,225ක් වටිනා වාහන ගාල් කිරීමේ අංගනයක් හා රු.1,082,250ක් වටිනා බිත්ති බැඳීමක් වන අතිරේක නොවන වැඩද ඇතුළත් කර ප්‍රසම්පාදන | අමතර කාර්යයන් සඳහා රුපියල් මිලියන 11.1ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද වැඩ ඉංජිනේරු විසින් නිර්දේශ ලබාදී තිබුණේ# අනුමත පිරිවැය වන රුපියල් මිලියන 367 තුල ගෙවීමට හැකිනම් පමණක්# එම කාර්යය කිරීම සඳහා පමණි. උක්ත ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව විචලනයකින් තොරව නිම කළ යුතු බවට වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය උල්ලංඝනය කර නොමැත. ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති^ සහ අංශ ප්‍රධානීන්ගේ අවශ්‍යතාවය අනුව ඔවුන් විසින් සිදුකළ ඉල්ලීම් සළකා බලා මෙම අයිතම 05 වැඩ කොටස් අමතර ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත. නමුත් ඒ තුලින් කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය විචලනය නොවේ. පීඨයේ අවශ්‍යතාවය හා ඉල්ලීම පරිදි යෝජනා වූ අතිරේක වැඩ කොටස් කොන්ත්‍රාත්කරු ලවා ඉටු කරවා ගැනීමටත් ඒ සඳහා කිසිදු අමතර | අමතර පිරිවැයකින් තොරව අදාල සීමාවන් තුල ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාවලියට පටහැනිව තරඟකාරී මිල ගණන් කැඳවීමකින්ද ගිවිසුමකින්ද හා අනුමැතියකින්ද තොරව අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම ආරම්භ කර තිබුණි. | පිරිවැයක් නොදැරීමටත් විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. ප්‍රධාන කොන්ත්‍රාත්තුව යටතේ මෙම අතිරේක වැඩ කොටස් නිම කිරීමට හැකිවීම තුල වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සොයා මිල ගණන් කැඳවීමක් අවශ්‍ය නොවුණි | |
| (ආ) | 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 14 ක්ද, 2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 15ක් සඳහා පිළිවෙලින් රු.60,887,137ක් හා රු.452,953,884ක් වශයෙන් වූ කෙරීගෙන යන වැඩවල කිසිදු ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුවී නොතිබුණි. | මෙම කර්මාන්තයන්හි අවසන් බිල්පත් නිරාකරණය කරන අවස්ථාවේදී ඒවායේ ශේෂ අඩු වීම සිදු වේ. මෙසේ මෙම දෙවර්ෂය තුළ ලැබුණු අවසන් බිල්පත්/ රැඳවුම් බිල්පත් මත මෙම ශේෂ අඩු වන අතර 2017 වර්ෂයේ සිට මෙහි වැඩි වටිනාකමක් පෙන්නුම් කර ඇත්තේ වෛද්‍ය පීඨය ඉතා ඉහල වටිනාකමකින් යුක්තව ඉදි කිරීමේ යෙදෙන බැවිනි. | බිල්පත් කඩිනමින් නිරවුල් කර වගකීම් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.9** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------------**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. | | |

| කාර්ය මණ්ඩල විස්තර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| <u>අධ්‍යයන</u> | | | | |
| ස්ථිර(පීය, ඒකක සහ පුස්තකාල) | 238 | 183 | 55 | - |
| සහායක | 25 | 12 | 13 | 01 |
| කොන්ත්‍රාත් | 124 | 120 | 04 | - |
| | 387 | 315 | 72 | 01 |
| <u>අනධ්‍යයන</u> | | | | |
| විධායක | 40 | 36 | 04 | - |
| ද්විතීය | 229 | 183 | 46 | - |
| ප්‍රාථමික | 242 | 206 | 36 | - |
| | 511 | 425 | 86 | - |
| මුළු එකතුව | 898 | 740 | 158 | 01 |

| | | |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද වර්තමාන කාර්යසාධන වාර්තාව අනුව සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 18ක් වන අතර ස්ථිර අධ්‍යයන හා සහාය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 26ක් වූ අතර, වයඹ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලද වෛද්‍ය පීඨය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය 14 දෙනෙකු අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල අධ්‍යයන කටයුතු සඳහා දෙදෙනෙකු බඳවාගෙන තිබූ අතර, නිර්දේශිත ආචාර්යවරුන් 05 කු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි . | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 876 යටතේ ඇති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නාම ලේඛන සකස් කර එවීමේදී ඇතිවන ප්‍රමාදයද පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලිය කෙරෙහි බලපෑමක් ඇති කරයි. 2018.12.21 දිනට පැවති අනධ්‍යයන, පරිපාලනමය නොවන තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 82ක් වන අතර එම තනතුරු 2019 වර්ෂය ඇතුළත පිරවීමට අපේක්ෂා කෙරේ. | කාර්යය මණ්ඩල පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක PED/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 01/2014 අනුව විශ්වවිද්‍යාලය විසින් සංයුක්ත සැලැස්ම සමග පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුල එම චක්‍රලේඛය පරිදි වූ අනුමත කාර්ය මණ්ඩල විස්තර, අදාල වර්ෂයේ අයවැය ලේඛනය හා අක්මුදල් අවශ්‍යතා සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් අයිතමය සඳහා අයවැයගත මුදලද ඇතුළත් කර ඇති අතර 2019-2023 දක්වා වූ කාලය සඳහා පිළියෙල කරනු ලබන සංයුක්ත සැලැස්මෙහි අනුමත කාර්ය මණ්ඩලය විස්තර ඇතුළත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුණු 164 ක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට තිබූ අතර. අරමුණු 30 ක් ඉටුකරගෙන නොතිබුණි . | 2018 වර්ෂයේදී කිරීමට සැලසුම් කළ එහෙත් 2018 වර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වූ ක්රියාකාරකම් 2019 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර 2019 වර්ෂයේදී අවසන් කිරීමට බලාපොරොත්තු වෙමු. | අරමුණු ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැටුප් ගණනය කිරීම්, ශිෂ්‍ය බඳවා ගැනීම්, ශිෂ්‍ය ඉගැන්වීම් කටයුතු හා ඒ සඳහා කථිකාචාර්යවරු, බාහිර කථිකාචාර්යවරු යෙදවීම හා ඒ සඳහා ගෙවීම් කිරීම, වත්කම් ආරක්ෂාව සඳහා යොදා ඇති අභ්‍යන්තර වැඩ පිළිවෙලවල් පරීක්ෂාව ආදිය ඉහත වැඩ සටහනට ඇතුලත් කර නොතිබුණි | ක්ෂේත්‍රයන්හි අනුගමනය කර ඇති අභ්‍යන්තර වැඩ පිළිවෙල පරීක්ෂා කිරීමට සැලසුම් කරනු ලබයි. 2020 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේදී විගණන විමසුමෙහි සඳහන් ක්ෂෙත්‍රයන්ද ආවරණය වන පරිදි වැඩසටහන සැලසුම් කිරීමට අපේක්ෂා කෙරේ. | අභයන්තර විගණන වැඩසටහන් සංශෝධනය කර නව විෂයයන් ඇතුළත් කල යුතුය. |

## 4.3 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති 07ක් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.296,700,000ක ප්‍රතිපාදන වලින් සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක් තුලවූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි . | 2018 විශ්වවිද්‍යාලයට මූලධන ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 400ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් 2018 වර්ෂයේ මුලදී වෙන්කර තිබුණි. 2018 මැයි මස භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද ප්‍රතිපාදන නිදහස් කිරීමේ පත්‍රිකාව අනුව රුපියල් මිලියන 100ක මුදලක් හිඟ බිල්පත් පියවීම මූලධන ප්‍රතිපාදන යටතේ ලබාදී තිබුණි. එලෙස වෙන් කරන ලද රුපියල් මිලියන 100ක මුදල කෙරීගෙන යන ව්‍යාපෘති අතර මාරු කරන ලෙස 2018.09.14 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලදී. එහෙත් එලෙස මාරු කිරීමට කටයුතු නොකරන ලදී. | විස්තරාත්මක ඇස්තමේන්තු තුලින් අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිපාදන ලබාගැනීමට සැලසුම් කල යුතු අතර, අදාල ව්‍යාපෘති කඩිනමින් ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

**4.4** තිරසර සංවර්ධන අරමුණු

**----------------------------**

| <u>**විගණන නිරීක්ෂණ**</u> | <u>**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**</u> | <u>**නිර්දේශය**</u> |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික අයවැය දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ පිළිබඳව ආයතනය දැනුවත් වී තිබුණද එක්සත් ජාතීන්ගේ -2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර තිරසර සංවර්ධනයට දායක විය යුතුය. |